**ශීර්ෂය 437- ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**

---

## 1 මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය නොකළ මතය

ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජුනි 01 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජූලි 28 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශවලින් 2021 දෙසැම්බර් 31 දිනට ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වු ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 ආදායම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2020 මැයි 26 දිනැති අංක TOD/REV/M2/01 දරණ භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛයේ ඡේද අංක 02 ප්‍රකාරව 2021 වර්ෂය තුළ එකතු කිරීමට අපේක්ෂිත ආදායම් පිළිබඳව ඇස්තමේන්තු මුදල් රෙගුලාසි 85(1), (2) ප්‍රකාරව හැකිතාක් තාත්විකව හා නිවැරදිව සකස් කර භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂය තුළ එකතු කිරීමට අපේක්ෂිත ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය මඟින් අයකර භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කරන අපගමන බදු ආදායම් පිළිබඳ ඇස්තමේන්තු සකස් කර නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරි වර්ෂ සඳහා නියමිත පරිදි ඇස්තමේන්තු සකස් කිරීමට සටහන් කර ගන්නා ලදී. | අපගමන බදු ආදායම පිළිබඳ ඇස්තමේන්තු සකස් කර නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) මුදල් රෙගුලාසි 85(2) (අ) ප්‍රකාරව මූලික ආදායම් ඇස්තමේන්තුව රු. බිලියන 19 සිට රු. බිලියන 4 දක්වා සංශෝධනය කිරීමේ වාර්තා පවත්වාගෙන ගොස් නොතිබුණි. | 2022 වර්ෂයේ සිට පෙන්වා දී ඇති පරිදි කටයුතු කිරීමට සටහන් කරගන්නා ලදී. | මූලික ආදායම් ඇස්තමේන්තු පසුව සංශෝධනය කරන්නේ නම් එයට හේතු සහිතව ඒ බව ආර්ථික කටයුතු හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත වාර්තා කළ යුතු අතර එම සංශෝධිත වාර්තා පවත්වාගෙන යා යුතුය. |
| (ඇ) මුදල් රෙගුලාසි 128(2) (ඇ) ප්‍රකාරව හිඟ ආදායම් පිළිබඳ අර්ධ වාර්ෂික වාර්තා හෝ හිඟ ආදායම නොමැති නම් හිස් වාර්තාවක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | -එම- | හිඟ ආදායම් පිළිබඳ අර්ධ වාර්ෂික වාර්තා නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |

## 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශයේ වැඩසටහන් අංක 01 හි වැය විෂයයන් 06 ක් සඳහා වෙන් කරන ලද රු.6,000,000 ක ප්‍රතිපාදන සියයට 100ක්ම ඉතිරි කර තිබුණි. තව ද වැඩසටහන් අංක 01 හි තවත් වැය විෂයයන් 06ක් සඳහා වූ ප්‍රතිපාදනයන්ගෙන් 2021 වර්ෂය තුල ඉතිරි කර තිබූ ප්‍රතිපාදනය රු.1,044,819,642 ක් විය. එය එම වැය විෂයයන් සඳහා වූ ප්‍රතිපාදිත මුදලින් සියයට 55 සිට සියයට 95 දක්වා වූ පරාසයක පැවතුනි. | ප්‍රතිපාදන ඉතිරිවීමට කොවිඩ් වසංගත තත්ත්වය ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. | ප්‍රතිපාදනයන් නියමිත පරිදි උපයෝජනය තුලින් අපේක්ෂිත කාර්යයන් ලබා කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | 2021 වර්ෂය සඳහා අමාත්‍යාංශයේ වැඩසටහන් වෙනුවෙන් රු.2,085,964,000 ක මුදලක් ප්‍රතිපාදනය කර තිබූ අතර එයින් රු.116,928,632 ක මුදලක් එනම් සියයට 53.5 ක ප්‍රතිශතයක් උපයෝජනය කර නොතිබුණි. | කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් කාර්යාල කටයුතු සාමාන්‍ය පරිදි පවත්වාගෙන යාමට නොහැකි වීම, කාර්ය මණ්ඩලය පැමිණීම සීමා වීම, අපේක්ෂිත පරිදි පුරප්පාඩු සපුරාගත නොහැකි වීම, නව ගොඩනැගිලි පරිශ්‍රය වෙත විතැන්වීමේ කටයුතු ප්‍රමාද වීම වැනි කරුණු ඒ සඳහා හේතු විය. | -එම- |
| (ඇ) | 2021 වර්ෂයට අදාලව අමාත්‍යාංශයේ වැඩසටහන් අංක 2 අපනයන කලාප සංවර්ධනය යටතේ ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් රු. 1,900,000,000 ක් ප්‍රතිපාදන වෙන් කර තිබූ නමුත් එයින් රු.859,000,000 ක් පමණක් වැය කර තිබූ අතර එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 45 ක් පමණක් වී තිබුණි. තවද මෙම ප්‍රතිපාදනයට අදාල නොවන වියදමක් වූ මඩකලපුව ගුවන් තොටුපලෙහි ධාවන පථය ඉදිකිරීමට අදාල මාර්ග සංවර්ධන අධිකාරියට ගෙවියයුතු හිඟ මුදලක් වූ රු.මිලියන 53.6ක් මහා භාණ්ඩාගාරයේ උපදෙස් පරිදි මෙම වැය ශීර්ෂය යටතේ ගිණුම් ගත කර තිබුණි. එමෙන්ම, මෙම ගෙවීම සම්බන්ධ ප්‍රතිපාදන නිදහස් කිරීමේ ලිපියට අමතර මූලාශ්‍ර ලේඛන හෝ ලිඛිත සාක්ෂි කිසිවක් අමාත්‍යාංශය විසින් ලබාගෙන නොතිබුණි. | ප්‍රතිපාදන ඉතිරිවීමට කොවිඩ් වසංගත තත්ත්වය ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. මාර්ග සංවර්ධන අධිකාරිය විසින් මෙම ඉල්ලීම 2020 දෙසැම්බර් 18 දින අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබුණි. ඒ පිළිබඳ ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් විමසීමෙන් ලද අනුමැතිය මත ගෙවීම් සිදු කරන ලදී. මෙම ගෙවීමට සම්බන්ධ වවුචර්පත් හා ඊට අදාල ලිපිලේඛනවල පිටපත් මහාමාර්ග අමාත්‍යාංශය වෙතින් ගෙන්වා ගැනීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රතිපාදනයන් නියමිත පරිදි උපයෝජනය තුලින් අපේක්ෂිත කාර්යයන් ලබා කර ගැනීමට කටයුතු කළ යුතු වේ. එමෙන්ම, වර්ෂයේ සැලසුම් නොකරන ලද පෙර වර්ෂවලට අදාල ගෙවීම් සිදු නොකිරීමට හැකිතාක් කටයුතු කළ යුතු අතර එසේ ගෙවීමට සිදුවූයේ නම් ඊට අදාල මූලාශ්‍ර ලේඛන සියල්ල ලබාගත යුතු වේ. |

## 2.3 ගණකාධිකාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2022 වර්ෂය වන විට වැඩබැලීමේ පදනමින් අභ්‍යන්තර විගණක වරයෙකු පත්කරගැනීමට කටයුතු ඉටුකර තිබෙන අතර 2022 වර්ෂයේ සිට අදාල වාර්තා එවීමට කටයුතු කළ හැකි වේ. | විධිවිධාන අනුව කටයුතු කළ යුතුවීම. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 104(3) හා 104(4) | 2021 වර්ෂය තුලදී අමාත්‍යාංශයේ වාහන 03 කට අනතුරු 04ක් සිදු වී තිබූ අතර අදාල පරීක්ෂණ කමිටු පත් කිරීම සහ ප්‍රාරම්භක වාර්තාව හා අවසන් වාර්තාව ලබාදීම සඳහා මාස 03 සිට මාස 09 දක්වා කාලසීමාවක් ගත කර තිබුණි. | රථය අලුත්වැඩියාව සඳහා ප්‍රමාද වී භාර දීම, රක්ෂණාවරණ ලැබීම සම්බන්ධ නිශ්චිත තීරණ ප්‍රමාද වීම හා එවකට පැවති කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් පරීක්ෂණ කමිටු පත් කිරීම හා වාර්තා ලබා දීම ප්‍රමාද විය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව යම් අනතුරක් සිදු වී පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට දින 07 කට වඩා කල් ගත වන්නේ නම් ප්‍රාරම්භක වාර්තාව වහාම ඉදිරිපත් කළ යුතු අතර පූර්ණ වාර්තාව තුන් මසක් ඇතුලත ලබා දිය යුතුය. එමෙන්ම, යම් අනතුරක් සිදු වූ වහාම අදාල පරීක්ෂණ කමිටු පත් කිරීම සිදු කළ යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය | සියළුම අමාත්‍යාංශ ප්‍රධානීන් විසින් තම ආයතන වෙනුවෙන් අනුමත අයවැය ඇස්තමේන්තු ක්‍රියාත්මක කිරීම සඳහා තුන් අවුරුදු මධ්‍යකාලීන අයවැය රාමුව තුල නියමිත මුදල් වර්ෂයට අදාළ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතු වුවත් අමාත්‍යාංශය විසින් 2020 සහ 2021 වර්ෂයන් සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | සැලසුම් අංශයක් අමාත්‍යාංශය තුල ස්ථාපිත කර නොතිබීම හේතුවෙන් අමාත්‍යාංශය සඳහා ක්‍රියාකාරි සැළැස්මක් සකස් කිරීමේ කටයුතු අතපසු වී ඇත. | සියළුම අමාත්‍යාංශ විසින් නියමිත මුදල් වර්ෂයට අදාළ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතු වේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 වත්කම් කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2017 දෙසැම්බර් 21 දිනැති අංක 02/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 02(ii) ඡේදය ප්‍රකාරව 2021 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශය යටතේ පවතින වාහන 03ක් විධිමත්ව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වාහන පවරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී. | වාහන විධිමත්ව පවරාගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතු වේ. |

**3.2 කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශයට අයත් වාහනයක් වාර සේවාවට ඉදිරිපත් කළ අවස්ථාවකදී වාහනයේ සාමාන්‍ය වාර සේවාවට අමතරව පූර්ව අනුමැතිය ලබා නොගෙන එම ආයතනයෙන්ම වාහනයේ අලුත්වැඩියාවන් ද සිදු කර ගෙන රු.77,926 ක් ගෙවීම් කර තිබුණි. | වාහනය නියම ධාවන තත්ත්වයේ පවත්වා ගැනීමට එය සිදුකර තිබේ. කෙසේ වුවද ඉදිරියේදී පූර්ව අනුමැතියකින් තොරව එසේ නොකිරීමට අදාල ආයතනයට දැනුම් දුනි. | අමාත්‍යාංශයේ පූර්ව අනුමැතිය ලබා ගැනීමකින් තොරව වාහන අලුත්වැඩියාවන් සිදු නොකළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අමාත්‍යාංශයේ ඇතැම් වාහන වාර සේවාවන් සිදු කිරීමේදී අනුමත කර ඇති ආයතනයට පරිබාහිරව වෙනත් ආයතනයන්ගෙන් සිදු කළ අවස්ථා පැවතුනි. | රාජ්‍ය ඇමතිතුමාගේ රාජකාරි ස්වභාවය අනුව වෙනත් ආයතනයකින් වාර සේවාව සිදුකර ගැනීමට සිදු වූ බව රාජ්‍ය අමාත්‍ය සම්බන්ධීකරණ ලේකම් වාර්තා කර ඇත. මෙම සේවා ආයතනය හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ලියාපදිංචි වාර සේවා ආයතනයක් වූ අතර නියෝජිත ආයතනය හැරුණු විට හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ලියාපදිංචි ආයතනවලින් හදිසි අවස්ථාවන්හිදී සේවා සිදුකර ගැනීම සාමාන්‍යයෙන් සිදු වේ. | වාහන වාර සේවාවන් සිදු කිරීමේදී ලිඛිත අනුමැතිය ලබා දී ඇති ආයතනයෙන්ම සිදු කළ යුතු වේ. |

## 4. යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 134(2) වගන්තිය අනුව අමාත්‍යාංශයේ මුදල් කටයුතු පිළිබඳව ක්‍රමවත් වූ ද ප්‍රමාණවත් වූ ද කාර්යක්ෂම වූ ද පරීක්ෂාවක් කිරීමට හැකි වනු පිණිස අමාත්‍යාංශයේ මුදල් කටයුතු වලට අදාළ අංශයන් සමීක්ෂණයට භාජනය කිරීම සඳහා අභ්‍යන්තර විගණන වැඩසටහන් සුපරීක්ෂාකාරීව පිළියෙළ කළ යුතු අතර එහිදී විගණකාධිපති විමසා උපදෙස් ලබා ගත යුතු වුවත් අමාත්‍යාංශය එලෙසින් 2020 හා 2021 වර්ෂයන් සඳහා අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස් කර නොතිබුණි. | මෙම අමාත්‍යාංශය සඳහා 2021 වර්ෂයේදී අභ්‍යන්තර විගණක වරයෙකු පත්වී නොතිබීම හා අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත වී නොතිබීම නිසා අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීමේ කටයුතු අතපසු වී තිබිණි. නමුත් 2022 වර්ෂයේදී වැඩ බැලීමේ පදනමින් අභ්‍යන්තර විගණක වරයෙකු පත්කරගැනීමට කටයුතු කර තිබේ. | අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම සඳහා වාර්ෂිකව අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස් කළ යුතු වේ. |

**5. මානව සම්පත් කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ අනුමත සේවක සංඛ්‍යාව, තත්‍ය සේවක සංඛ්‍යාව සමඟ සැසඳීමේ දී පුරප්පාඩු 26 ක් පැවති අතර ඊට ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 07ක් , තෘතියික මට්ටමේ පුරප්පාඩුවක් හා ද්විතියික මට්ටමේ පුරප්පාඩු 10ක් ඇතුලත් වී තිබුණි. | 2021 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ පැවති පුරප්පාඩු 26 න් පුරප්පාඩු 10 ක් පහත තනතුරු යටතේ 2022 අප්‍රේල් මස වන විට සම්පූර්ණ කර ගැනීමට හැකියාව ලැබී ඇත.<br>ජ්‍යෙෂ්ඨ මට්ටම - 5<br>ද්විතියික මට්ටම - 5<br>අනෙකුත් පුරප්පාඩු සඳහා ද නිලධාරීන් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | අත්‍යවශ්‍ය තනතුරු සඳහා වන පුරප්පාඩු කාලනුරූපීව සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වේ. |